## 52

# Renoirගේ සිතුවම්වලින් පිළිබිඹු වන මධ්‍යම පාන්තික ජන ජීවිතය

*කේ. එම්. ඩී. සුලෝචනා සෙනෙවිරත්න* [1]
HU/2011/022

ආලෝකානුවාදය, හිරු උදාවේ විප්ලවය ලෙසින් හඳුන්වනු ලබන උපස්ථිතිවාදය 19 වන සියවසේ බිහිවූ කලා ශෛලියකි. උපස්ථිතිවාදී සිත්තරුන් අතර ඉතා ප්‍රකට සිත්තරෙකු වන Piere Auguste Renoir මධ්‍යම ප්‍රංශයේ බිහිවූ ශ්‍රේෂ්ඨ ශිල්පියෙකි. කුර්බේගේ සහ මනේගේ ලබා ඇති මොහු ස්වකීය ශෛලියක් ගොඩනගා ගනිමින් සිතුවම් රැසක් නිර්මාණය කර ඇත. ඔහුගේ සිතුවම් පිළිබඳ ව අධ්‍යනයේ දී ද්වීතියික මූලාශ්‍රය ලෙස පුස්තකාල පරිශීලනයත් තෘතියික මූලාශ්‍ර ලෙස සඟරා සහ අන්තර්ජාලය දැක්විය හැකි ය. තරුණ ප්‍රංශ ලලනාවන් තම තේමා සඳහා යොදාගෙන ඇති Renoir ආටෝපකාරී මධ්‍යම පාන්තික ජන ජීවිතය පිළිබඳ විග්‍රහයක් තම සිතුවම් තුළින් ප්‍රකට කරයි. විවිධ වූ ඉරියව් නාට්‍යානුරූපීව කැන්වසයට ගෙනෙන අතර එළිමහනේ විනෝද වන සහ බාල් නැටුම් නටන ජනීජනයා සහ නාට්‍ය නැරඹුම් මැදිරි හෝ විසිතුරු මලින් පිරි උද්‍යාන තම සිතුවමට ගලපා ඇත. ගෘහ අභ්‍යන්තර සිතුවම් රැසක් නිරූපිත අතර එහි විවිධ වූ මෝස්තරාංග සහිත කාපට්, පෝච්චිවල සිටුවන ලද ගස්, විසිතුරු ඇඳුම් පැළඳුම් සුඛෝපභෝගී තිර රෙදි ආදියෙන් පොහොසත් ය. තරුණ ප්‍රංශ ලලනාව සංගීතයට පෙම් බඳිමින් සංගීතයට සමවැදී සිටින බහුල ව නිරූපිත තේමා අතර විය. ධනේෂ්වරයේ මිනිසුන්ගේ මවාපෑම් අතරේ පියානෝ වැයීම ප්‍රකට කරුණක් විය. මනුෂ්‍ය ජීවිතය ප්‍රීතියෙන් ඉතිරෙන බව දැක්වීමට Renoir උත්සුක වී ඇති බව ප්‍රකට කරයි. ඔහුගේ සිතුවම්වලින් ප්‍රකට කරනු ලබන ප්‍රකාශනාර්ථය වන්නේ ද එය යි. මධ්‍යම පාන්තික ජනයාගේ ලෝකය කැන්වසයේ සතර සීමාවට වඩා බෙහෙවින් විශාල ය. ඔහුගේ සිතුවම්වලින් නිරූපණය වන්නේ ජීවිතයේ නිත්‍යතාව මෙන් ම මනුෂ්‍යයාගේ කායිකත්වය, අනෙකා පිළිබඳ හැඟීම, ප්‍රීතිවීම සඳහා පවතින මිනිස් හැකියාව හා සරාගිකත්වය ප්‍රකට කරයි. එළිමහනේ විනෝදකාමී ජීවිතයක් ගත කරන්නට, උත්සව පවත්වන්නට, විනෝද වන්නට ඉමහත් කැමැත්තක් දක්වන්නා වූ මධ්‍යම පාන්තිකයාගේ ජීවිතයේ සැහැල්ලු බව මනාව පිළිබිඹු කරන්නාවූ සිතුවම් රැසක් නිර්මාණය කර ඇත. එකිනෙකා වැළඳ ගනිමින් ආලිංගන නර්තනයේ යෙදෙන කාන්තාවන් සහ පිරිමින් අතරේ අල්ලාප සල්ලාපයේ යෙදෙමින් සිනහ වන්නාවූ ඇතැමුන් ආදිය ග්‍රහණය කරගන්නා Renoir ධාරාණුවාදයේ ලක්ෂණ එකකුදු මඟ නොහරී. ඒ අනුව, මෙම පර්යේෂණයේ මූලික අරමුණ බවට පත්වන්නේ Renoirගේ සිතුවම්වලින් පිළිබිඹු වන මධ්‍යම පාන්තික ජන ජීවිතය පිළිබඳ ව විමසා බැලීම ය.

ප්‍රමුඛ පදඃ මධ්‍යම පාන්තික ජන ජීවිතය, උපස්ථිතිවාදය, ශෛලිය, ධාරාණුවාදයේ ලක්ෂණ

---

*1 දෘශ්‍ය කලා හා සැලසුම්කරණය (විශේෂවේදී) තෙවන වසර*